# සාරාංශය

ළමා පුරපුර ජාතියක් සතු වටිනා සම්පතකි. අනාගතයේ රටක් භාරවන්නේ ඔවුන්ටය. මේ නිසා ප්‍රතිභා චින්තන අවධියේ පසුවන සිසුන්ගේ ගණිත සාධනය සඳහා ස්මෘතිය බලපාන්නේ කෙසේදැයි විමසා බැලීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනය සඳහා දෙවෙනි වසර සිසුන් යොදාගෙන ඇත. මෙම සිසුන්ගේ ගණිත සාධනය පිරික්සීමේදී දැනුම ලබාදීමට පාදක වන චින්තනය මෙහෙයවන ආකාරය පිළිබඳව හා එහි ක්‍රියාකාරිත්වය සොයා බැලීම ඉතා වැදගත් වන බව පෙන්වා දීම අවශ්‍යයෙන්ම සිදුවිය යුත්තකි.

පළමුවෙනි පරිච්ඡේදයෙන් ප්‍රතිභා චින්තන අවධියේ පසුවන සිසුන්ගෙ ගණිත සාධනය සඳහා ස්මෘතිය බලපාන්නේ කෙසේද? ඒ අනුව සිසුන්ගේ ගණිත සාධනය ඉහළ මට්ටමක පවතින්නේ මනා ස්මෘති හැකියාවක් රැඳි ශිෂ්‍යයින් වෙතද, ගණිත සාධනය පහළ මට්ටමක පවතින්නේ ස්මෘති ශක්තිය අඩු ශිෂ්‍යයින් වෙතද යන්න පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. ඒ හා සම්බන්ධව සමාජ, මනෝ විද්‍යාත්මක පසුබිම හා පර්යේෂණ ගැටළුවේ ස්වභාවය වැදගත්කම හා අදාලත්වය, පද නිර්වචනය හා සීමාද මෙම පරිච්ඡේදයෙන් දැක්වේ.

මෙම අධ්‍යයනයේ දෙවන පරිච්ඡේදයෙන් සාහිත්‍ය විමර්ශනය සිදු කෙරෙන අතර ප්‍රතිභා චින්තන අවධියේ පසුවන සිසුන්ගේ ගණිත සාධනය සඳහා ස්මෘතිය බලපාන අන්දමත්, දැනුම ලබාදීමට පාදකවන චින්තනය ක්‍රියාකරන්නේ කෙසේදැයි පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කර ඇත.

තුන්වන පරිච්ඡේදයෙන් පර්යේෂණ ක්‍රමවේදය දැක්වෙන අතර පර්යේෂණ උපකරණ වන පරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡාවන් පිළිබඳව විස්තර දක්වනු ලැබේ. තවද නියැදිය තෝරාගත් ආකාරයද එහි සීමාවන්ද මෙම පරිච්ඡේදයටම ඇතුලත් කර ඇත.

මෙම පර්යේෂණයෙහි හතරවන පරිච්ඡේදයෙන් අධ්‍යයනයේදී ලබාගත් දත්ත ඉදිරිපත් කර එම විශ්ලේෂණයේ ප්‍රතිඵල සංඛ්‍යාත භාවිතයෙන් ඉදිරිපත් කර ඇත.

පස්වෙනි පරිච්ඡේදයේදී සමීක්ෂණයෙන් ලත් ප්‍රතිඵල සමාලෝචනයට භාජනය කරමින් එළඹෙන ලද නිගමනත් ඒ සඳහා අනාගතයේ ගතහැකි පියවර පිළිබඳ යෝජනාත් ඉදිරිපත් කර ඇත.